

# ඔවුනට අපේ සහය අවශ්‍යයි
## අපි නැවත එක්වෙමු

පසුගිය වසරේ සන්නස කලාපයකින් "ඔවුනට ඔබේ පිහිට අවශ්‍යයි" යන මැයෙන් වවුනියාවේ ඉතා දිළිඳු පවුලක කතාව අපි ඔබට ඉදිරිපත් කළෙමු. එයට ඔබ සියලු දෙනා දැක්වූ අති විශාල සහයෝගය නිසාම එම අසරණ ජීවිත වලට සැබෑ වෙනසක් කිරීමට අපට හැකිවිය. මෙවරත් අපි ඔබ වෙත ගෙන එන්නේ අප මවු බිමේ වත් අන්ත අසරණ දරු පවුලක ඉතා දුක්බර කතා පුවතකි.

කඩ වීදිය තෙඹුවන කලුතර යන ලිපිනයෙහි තාවකාලිකව පදිංචි නිහාල් සහ අයිරාංගනී සුරතල් දරු පැටවුන් තිදෙනෙකුගේ දෙමා පිය යුවළකි. ඔවුනට මේ දරුවන් සහ දිළිඳු කම හැරුණ විට තමන්ගේ කියා වෙන කිසිම වත්කමක් නැත.

52 හැවිරිද නිහාල් එදිනෙදා ලැබෙන කුලී වැඩකින් දරුවන්ගේ කුසගින්න නිවන්නට දැඩි සටනක යෙදෙයි. 46 හැවිරිදි අයිරාංගනී හට කුඩා කල ඇතිවූ ස්නායු දුර්වලතාවකින් ශ්‍රවණය අහිමි වී ඇත.

දස හැවිරිදි වැඩිමහල් දියණිය 6 වසරෙත් අට හැවිරිදි දෙවෙනි පුතා 3 වසරෙත් සය හැවිරිදි බාල දියණිය 1 වසරෙත් කලුතර තෙඹුවන කණිෂ්ඨ විද්‍යාලයේ ඉගෙනුම ලබති.



මෙම පවුලේ කුඩා පුතුහට බහ තෝරන අවදියේ සිදුවූ බිහිසුණු රිය අනතුරකින් එක් පාදයකටත් හිසටත් බරපතල ලෙස තුවාල සිදුවී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ පාදයේ ඇදයක් සහ වරින් වර මතුවන හිසේ වේදනාවකිනුත් ඔහු පිඩා විදියි.

ඔවුන්ගේ කතාව තවමත් අවසාන නැත. මේ පවුලේ පස් දෙනාම දිවි ගෙවන්නෙ පුංචිම පුංච කුලී කාමරයක. දරුවන්ගේ නිදන කාමරල විසිත්ත කාමරය ආලින්දය කෑම කාමරය යනාදී සෑම කාමරයකටම තියෙන්නෙ මේ පුංචි කුලී කාමරයේ.

මෙය කියවන ඔබත් මමත් කොයි තරම් වාසනාවන්තද? අපේ දූ දරුවෝ මොන තරම් පිං කරල ඇතිද? මෙම දරුවන් පාවිච්චි කරන්නෙ එයාලගෙ පාසලේ වැසිකිලිය සහ ලිඳයි. එයටත් යන්න පුලුවන් පාසල් වෙලාවෙන් පසුව. ඔබ අප සියලු දෙනා භුක්තිවිදින සැප සම්පත් වලින් මේ පවුලට ඔවුන්ගේ දෛවය ලබා දි ඇත්තේ කොයි තරම් අල්ප මාත්‍රයක්ද?



අපේ මිතුරුකැල මෙවර උත්සාහ දරන්නෙ මෙම අහිංසක පවුලට නිදහසේ ජිවත් වෙන්න පුංචි නිවහනක් දරුවන්ට ඔවුනගේ පාසල් කටයුතු කර ගැනිමට සුදුසු පරිසරයක් අසරණ මවට ශ්‍රවණය නැවත ලබාදීම සහ කුඩා පුතු හට නිසි ප්‍රතිකාරයක් ලබා දීම වැනි කටයුතු ඉටු කරන්නටය.

මේ අහිංසක මුහුණු වලට සිනහවක් එක් කරන්න අපිත් සමග එක්වන්න ඔබට කෙරෙන ඇරයුමයි මේ.

වැඩි විස්තර සඳහා අමතන්නත

සරත් විජේසූරිය - 0433 980 001
නයනා වීරක්කොඩි - 0425 787 484
සුමේදා පරණවිතාන - 0423 688 482

# ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ ඔස්ට්‍රේලියානු එකමුතුව බිහිවෙයි

ASWA
Association of Sri Lankan
Writers of Australia

ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ එකමුතුව ලෙස Association of Sri Lnkan Wrters of Australia සංවිධානය ප්‍රවීණ ලේඛක ඩී බී කුරුප්පු මහතාගේ මෙහෙයවීම යටතේ පසුගියදා බිහිවිය.

විසිරී සිටන ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන් එක් තැනකට එක් කර ඒ මගින් විප්‍රවාසී සිංහල සාහිත්‍යයට නව මගක් නිර්මාණය කර ගත යුතුය යන අදහස කාලයක් තිස්සේ සාකච්චාවට බඳුන් වෙමින් තිබුණ ද විවිධ හේතු කාරනා නිසා මේ අදහස මල් ඵල ගන්වා ගන්නට හැකියාවක් නොලැබුණි. කල් යමින් තිබූ ලේකක සංවිධානය පිහිටුවීමේ අදහස මල් ඵල ගැන්වෙන්නේ ප්‍රවීණ ලේඛක ඩී බී කුරුප්පු මහතාගේ හත් වන පොත් එළිදැක්වීමට සමගාමීවය.

සංගමය හරහා සාහිත්‍යගේ ඉදිරි ගමන වෙනුවෙන් විවිධ කාර්ය රැසක් කරන්නට බලාපොරොත්තු වෙයි. විප්‍රවාසී ලේඛක ලේඛිකාවනගේ පොත පත ප්‍රකාශයට පත් කර ගැනීමට අත හිත දීමේ සිට සිංහල පාඨක සමාජය ගොඩ නැගීම දක්වා වන විවිධ ව්‍යාපෘති රැසක් ඉදිරියේදී දියත් කරන්නට සංගමය අදහස් කරයි. ඒ සමගම ලේඛක ලේඛිකාවනගේ නිර්මාණ පිළිබඳ සංවාදයක් ඇති කිරීමද සිදුවනු ඇත.

මේ සඳහා ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ වාසය කරන සියලුම ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවනට එක්වන ලෙස සංගමය ආරාධනා කරයි. ඒ සමගම සංගමය හරහා ඉදිරියේදී කළ හැකි සේවා පිළිබඳ ඔවුන්ගේ අදහස් හා යෝජනා ද දැනගන්නට සංගමය කැමැත්තෙන් සිටියි.

දැනට සංගමයේ කැඳවුම්කරු ලෙස වරුණ සාවින්ද මහතා කටයුතු කරන අතර අනුශාසක ලෙස ඩී බී කුරුප්පු මහතා සහය වනු ඇත. නුදුරු දිනයකදී ආරම්භක මහා සභාව පවත්වා නිලධාරි මණ්ඩලයක් පත් කර ගන්නට සැළසුම් කර ඇත. එහි පළමු පියවර වශයෙන් සංගමයේ සාමාජිකත්වය ලබාගන්නා ලෙස ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ වාසය කරන ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවනට ආරාධනා කෙරෙයි. වැඩි විස්තර සඳහා පහත දැක්වෙන අංක වලට කතා කරන්න.

වරුණ - 0420 894 942
ජගත් - 0433 438 535